●නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මකව විඳ ගැනීම සහ මානව හිතවාදියෙක් ලෙස සමාජ ගත වීමේ හැකියාව ප්‍රදර්ශණය කරයි

**5.1.1කාළගෝල නාට්‍ය අගය කරමු.**

u

දික්තල කාළගෝල නාට්‍ය නරඹා රස විදින්නට ඇත.නාට්‍යයක් ලෙෂ එහි ඇති අගයකළ යුතු නාට්‍යමය රසය ඉහත පාඩමෙන් ඔබ විඳ ගන්නට ඇතැයි අප සිතන්නෙමු.

නාට්‍යමය සංගීතය රංග වින්‍යාසයන් රංගභූමි අලංකරණය රංග භූමි ආලෝකකරණය අංග රචනය වේෂ භූෂණ නොහොත් රංග වස්ත්‍ර නිර්මාණය ආදියේදී කළාවන් අතුරින් මෙම නාට‍්ටයේ දී සංගීත නිර්මාණයට වඩාත් සුවිශේෂී ස්ථානයක් හිමි වෙයි.ගීත ගායනා සියල්ලක් ම පාහේ ජනප්‍රිය වන්නට තරම් මධුර තනු හා උසස් සාහිත්‍යමය ගුණයක් ඇති ගීත රචනා ඉවහල් වන්නට ඇත.වේෂ භූෂනයන් ගැනද විශේෂයෙන් සදහන් කිරීම වටී.චරිත වල ලක්ශණ කැපී පෙනෙන අන්දමේ ඇදුම් නිර්මාණයන් දැකගත හැකි වන අතර අංග රචනය සහ වෙස් ගැන්වීම් වලදී ස්වභාවිකත්වය ඉක්මවා යන නාට්‍යධර්මී බවක් දැක ගත හැකිය.

දෙබස් හා සංවාද නාට්‍යයේ මාධ්‍යයයි.නාට්‍ය සාර්ථක හෝ අසාර්ථක කිරීමට නාට්‍යයේ භාෂාවට ද පුලුවන.ආර්. ආර් සමරකෝන් මහතා නිර්මාණය කළ කැළණි පාළම නාට්‍යයේ එන නාගරික මුඩුක්කු පරිසරයක භාෂා විලාසය එම නාට්‍යයට දැඩි රසවත බවක් එක්කොට තිබින.එසේ ම දික්තල කාළගෝල නාට්‍යයේද ජාතක කතා ජන මූලාශ්‍රය තුළ අපට හුරැ පුරැදු කතා විලාසයක් දැක ගත හැකි විය.අපට කාලාන්තරයක් තිස්සේ කනට හුරැ වූ ජාතක කතා බණ ඇසීමේ හා විරිදු පංතිවල හඬ නාට්‍යයේ ද ඇසෙයි.සංවාද හා භාෂාව ඉතා සරලය.ගීත ඉතා රසවත්ය.ප්‍රේක්ෂකයා නාට්‍යයේ මුල සිට අග දක්වීම රඳවා තබා ගැනීමට නාට්‍ය කරුවා සිය භාෂා භාවිතය හරහා සමත්වෙයි.

දික්තලා තම ස්වාමි පුරුෂයා පිළිබඳව දරන්නා වූ ආකල්පයත් ඇගේ ඉරනම පිල්බඳව පසුතැවුලත් “ඇන්නෑවේ මේ මළ කෝලම්”“රතදර සිරියා පරදන”වැනි ගීත මඟින් හෙළි දරව් වෙයි.“සැපසේ හිඳ කල් හැර සිතූ පැතූ සම්පත් ලැබෙයිද මට ”වැනි සංවාද මඟින් දික්තලාගේ අපේක්ෂාවන් කියැවෙයි.කාළගෝල කුස රජුන්ව උපමාවට ගැනී‍මෙන් හා තමා එවන් වීර කරියාවක් කළා යැයි උදම් අනයි.“පුරහඳ පායා වැනි මූණ තිගේ” වැනි ගීත වලින් පෙනෙන්නේ ඔහු දික්තලා ගැන දක්වන ආඩම්බරකාරී සතුටයි.කාළගෝල දික්තලාව රැගෙන තම නෑ පරපුර වෙත යන්නේ සැබෑ නොයිවසිල්ලකින් බව ගීත වලින් පෙනෙයි.

අනුෂාංගික අංග භාවිතය නාට්‍යයේ දෘෂ්ටිය භාෂා භාවිතය වැනි සියලු කරුණු කෙරේ ඇවධානය යොමු කරන විට දික්තල කාලගෝල වනාහී රසවත් හා සර්ථක නාට්‍ය නිර්මාණයක් ලෙෂ අගය කළ හැකි බව ඔබට මෙම කෙටි සටහන හරහා අවබෝධ වනු ඇත.